# රබන් කවි

01 නන් උතුම් පෙම්බර ගුණ රුසිරු රබානා
දැන් මෙමන් අතින් රැගෙන කරකවමි මනා
පෙම් සිතින් බලනු මැනවි දෙනෙත් පාමිනා
සන්තොසින් අසනු මැනවි කීම වෙන වෙනා

02 ත්‍රිවිධ ඥාන විදුරු පඬි අපේ මහ ගෞතම නම් මුණිඳු ................
ඒ බුදු වූ ගෞතම නම් මුණිඳු

දෙසූ දහම් ඇසුමට ඒ නිමලා - විසූ භවය යකුගෙන් තතු දැනලා
නසා ලන්ට කිවි දිවි අසලා බණ - දෙසූ විදුර පණ්ඩිතමයි ගෞතම

එදා ඒ ඇතු විදුමට ආ වැදි හට - පුදා ඒ දළ දෙක දීලා දැතට
සදා ඒ බුදු බව පැතු මාතා හට - පුදා වඳිමු අපි මල් ගෙන දෝතට

# චාමර කවි

01 සොබමන් දෙව්වරු සදෙනෙක් එතැනට
බසිමින් චාමර ගත්තේ සුරකට
ගනිමින් චාමර සැලුවේ මුනිඳුට
අපි දැන් දක්වමු ඒ රඟ සබයට

02 සුගත් මුණිඳු බුදුවන දා මරසෙන් බිඳ
ඇවිත් සුර බඹුන් රඟසේ විදිමින් නඳ
දොහොත් නගා සාදුකාර දෙන මෙන් අද
රැගත් චාමරය සැලුවේ මුණිඳුන් හට